# අභ්‍යන්තර සටහන
## ශික්ෂණ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2023-11- [illegible] |
| වෙත | සියළුම කාර්ය මණ්ඩලය වෙත |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | අදාළ විෂය භාර නිලධාරි |
| විෂයය | නිවාඩු දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම |
| ගොනු අංකය | BD/PGH/CPHMA/1/2013 |

නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර හා රාජකාරි දුම්රිය ගමන් බලපත්‍ර ඉල්ලුම් කිරීමේ දී අඩුපාඩු සහිතව ඉල්ලීම් සිදුකරන බැවින් ගැටලු සහිත අවස්ථා බහුලව වාර්තා වේ. එම නිසා දුම්රිය ගමන් බලපත්‍ර ඉල්ලුම් කිරීමේ දී පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

<u>**නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර**</u>

01. නිවාඩු දුම්රිය බලපත්‍රයට අදාල ඉල්ලුම් පත්‍රය(21 වෙනි පොදු අකෘති පත්‍රය) නිසි පරිදි සම්පූර්ණ කිරීම.(ආදර්ශ ඉල්ලුම් පත්‍රයක් මේ සමඟ අමුණා ඇති අතර පාලන අංශය ඉදිරිපිට ප්‍රදර්ශනය කර ඇත. )
02. අදාල අයදුම්පත්‍රයේ 01 සිට 09 දක්වා තොරතුරු නිවැරදි බවට පුද්ගලික ලිපි ගොණුව භාර නිලධාරියා ලවා සහතික කර ගත යුතුය.
03. දුම්රිය ගමනට අදාල දින සඳහා නිවාඩු නිසි පරිදි අනුමත කර ගත යුතු අතර ඒ පිළිබඳව අදාල ඉල්ලුම්පත්‍රයේ නිවාඩු අනුමත කල බලධාරියා හෝ විෂය නිලධාරියා මගින් සහතික කර ගත යුතුය.
04. විවාහක අයෙක් නම්,
    - කලත්‍රයා රජයේ සේවයේ නියුතු නම් හෝ රජයේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ලබා ඇත්නම් ඔහු/ඇය විසින් අදාල වර්ෂයේ දුම්රිය බලපත් ලබා නොගන්නා බවට ලිත් වර්ෂයකට වරක් ඔහු/ඇය සේවය කරන ආයතනයෙන්/අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලිපියක් ලබා දිය යුතු ය. මෙය සෑම වසරකම ජනවාරි මස ලබා දිය හැකිය.
    - කලත්‍රයා මෙම රෝහලේම සේවය කරයි නම් ඔහු හෝ ඇය විසින් ලිත් වර්ෂයකට වරක් අදාල වර්ෂයේ දුම්රිය බලපත් ලබා නොගන්නා බවට ලිපියක් ලබා දිය යුතුය මෙය සෑම වසරකම ජනවාරි මස ලබා දිය හැකිය.
    - දුම්රිය බලපත්‍ර ඉල්ලුම් කිරීමේදී දරුවන්ගේ වයස අවුරුදු 18 වැඩි නම්, ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහතික කල යැපීම් සහතිකයක් ලිත් වර්ෂයකට වරක් ඉදිරිපත් කල යුතුය.දරුවන්ට රැකියාවක් ලැබීම විවාහ වීම වැනි අවස්ථා අදාල ලිත් වර්ෂය තුලදී සිදු වුවහොත් දරුවන්ට හිමි දුම්රිය බලපත්‍ර අහෝසි වේ. දුම්රිය බලපත් ලබා ගන්නා සෑම අවස්ථාවකම නිලධාරියා විසින් ද දරුවන් තමන්ගෙන් යැපෙන බවට සහතික විය යුතුය.
    - ඉල්ලුම්පත්‍රයේ දරුවන්ගේ නම් සඳහන් කිරීමේ දී නමට ඉදිරියෙන් උපන් දිනය යෙදිය යුතුය.
05. අවිවාහක නිලධාරීන්ට පමණක් නිලධාරියාගෙන් යැපෙන තම මවට හෝ පියාට හෝ/සහ නිලධාරියාගෙන් යැපෙන සහෝදරයා/සහෝදරියට දුම්රිය බලපත් ලබා ගැනීමට හැකියාව ඇති අතර, ඒ සඳහා ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහතික කරන ලද යැපීම් සහතිකයක් ලිත් වර්ෂයකට වරක් ඉදිරිපත් කල යුතුයි. දුම්රිය බලපත් ලබා ගන්නා සෑම අවස්ථාවකම නිලධාරියා විසින් තම මව, පියා සහ සහෝදරයා/සහෝදරිය තමන්ගෙන් යැපෙන බවට සහතික විය යුතුය.
06. දුම්රිය බලපත්‍රය අවශ්‍ය දිනට <u>**අවම වශයෙන් දින 03කට පෙර**</u> අදාල ඉල්ලුම්පත්‍රය කාර්යාලය වෙත බාර දීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.
07. ගමන යෙදීමට නියමිත දින සිට දින 30 කට පෙර බලපත්‍ර නිකුත් නොකෙරේ.
08. යම් හෙයකින් බලපත්‍රයකින් අදාළ ගමන යාමට නොහැකි වුවහොත් යාමට නොහැකි වූ හේතූන්ද සඳහන් ඉල්ලීම් ලිපියක්ද සමඟ අදාළ බලපත්‍රය කාර්යාලයේ පාලන අංශයට වහාම භාර දිය යුතුය.
09. වර්ෂයකට ලබාගත හැක්කේ දුම්රිය බලපත් කට්ටල (යාමට හා ඒමට) 03ක් පමණි.
10. දුම්රිය බලපත්‍ර ලබාගැනීම පිළිබඳ වැඩි විස්තර සඳහා ආයතන සංග්‍රහයේ XVI පරිච්ඡේදය පරිශීලනය කරන්න.

<u>**රාජකාරි දුම්රිය ගමන් බලපත්‍ර**</u>

01. රාජකාරි දුම්රිය බලපත්‍ර ලබා ගැනීමේ දී, අදාල රාජකාරිය පිළිබඳ ලියවිලි ඉදිරිපත් කළ යුතු අතර ආයතන ප්‍රධානියාගෙන් ඒ සඳහා අනුමැතිය ලබාගත යුතුය. තවද අදාල දිනයන් සඳහා රාජකාරි නිවාඩු අනුමත කර ගැනීම අනිවාර්ය වේ.
02. රාජකාරි දුම්රිය බලපත්‍ර ඉල්ලුම් කිරීම සඳහා මෙහි ඇමුණුම 01 ලෙස දක්වා ඇති ආකෘතිය භාවිතා කරන්න.

**Dr. Upul Karunarathne**
MBBS, Msc (Med.Admin) MD(Med.Admin)
Director
Teaching Hospital, Badulla.

## රාජකාරී දුම්රිය බලපත්‍ර ඉල්ලුම් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය, ශික්ෂණ රෝහල බදුල්ල.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බදුල්ල ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වෙතට යි.

1.ඉල්ලුම්කරු/කාරි ගේ නම ..............................................................................

2.තනතුර .................................................. පන්තිය ................................................ ශ්‍රේණිය ..........................

3.තනතුර ස්ථිර ද, අතිරේක ද, තාවකාලික ද ?...............................................................

4.රාජකාරී දුම්රිය ගමන් බලපත්‍ර ඉල්ලුම් කරන රාජකාරියේ ස්වාභාවය.....................................

..................................................................................................................

5. ඉල්ලුම්කරු මෙම ගමනට අදාල රාජකාරිය සිදුකරන ස්ථානය..............................................

6.ගමන ආරම්භ කරන දිනය :-.................................ස්ථානය :- ................................සිට ............................දක්වා

7.ආපසු එන දිනය..........................................................................................

8.රාජකාරී දුම්රිය බලපත්‍රය අවශ්‍ය වන්නේ යාමට /ඒමට හෝ යාම් ඒම් දෙකම සඳහා ද යන වග ..........................

9.රාජකාරී නිවාඩු අනුමත කරගෙන තිබේද?

10.ඉල්ලුම්කරුගේ ,

ලිපිනය ..........................................

..........................................

..........................................

..........................................

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය ..............................

### අධීක්ෂණ බලධාරියාගේ නිර්දේශය

- අදාල කාලය සඳහා රාජකාරී නිවාඩු අනුමත කර ඇත.
- රාජකාරී දුම්රිය බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි.

අත්සන ..........................................

### රාජකාරී දුම්රිය බලපත්‍රය ලබාගැනීම සඳහා අනුමැතිය

- රාජකාරී දුම්රිය බලපත්‍රයක් නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි.

අත්සන ..........................................

### නිකුත් කළ රාජකාරී දුම්රිය බලපත්‍රය පිළිබඳ විස්තර

දුම්රිය බලපත්‍ර අංකය .......................................... නිකුත් කල දිනය..........................................

..........................................

..............................

විෂයභාර නිලධාරී